**ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

**---------**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් සංකේතය 2003.07.00 දරන රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ රැස්කරගැනීමට ඇස්තමේන්තුකර තිබුණු ආදායම රු.1,500,000,000 ක වුවත් රැස්කළ ආදායම රු.1,235,912,505 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත ආදායමෙන් රැස්කර ගැනීමට නොහැකි වූ ආදායම රු.264,087,495 ක් හෙවත් ඇස්තමේන්තුවෙන් සියයට 18ක් විය. | සහල් අලෙවිය ස.තො.ස ආයතනය හරහා සිදු කරන ලද හෙයින්, ස.තො.ස ආයතනය මගින් දිස්ත්‍රික් ලේකම් වරුන්ට මුදල් ගෙවීමේ හිඟහිටීම් නිසා මෙම හිඟ මුදල පෙන්නුම් කර ඇත. මෙම මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කර ඇති අතර, ඔවුන් විසින් ස.තො.ස ආයතනය දැනුවත් කර ඉදිරි කටයුතු ද කරමින් පවතී. | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 හිඟ ආදායම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පෙර වර්ෂයේ අවසානයට ආදායම් සංකේත අංක 2003.07.00 යටතේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනේ හිඟ ආදායම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ආදායම් ශේෂය ලෙස රු.1,675,035,730 ක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. එයින් රු.330,465,660 ක් එනම් මුළු ආරම්භක හිඟ ආදායමෙන් සියයට 19 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. හිඟ ආදායමෙන් අයකර ගත් රු.108,657,565 ක් සදොස් ලෙස වර්ගීකරණය කර ආදායම් සංකේත අංක 2003.99.00 දරන වෙනත් ආදායම් ලැබීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්, ගණන්දීමේ නිලධාරියා වශයෙන් පත්කර 2003.07.00 ආදායම් කේතය හඳුන්වාදීම කරනු ලැබුවේ 2019 දෙසැම්බර් 17 දින වූ නිසා අදාළ ආදායම් කේතය යටතේ හිඟ ආදායම හඳුනාගැනීමේ හැකියාවක් එම වර්ෂය සඳහා නොවුණි. එබැවින්, 2019 මූල්‍ය ප්‍රකාශන වල අගයන් ඇතුළත් නොකරන ලදී. කෙසේ නමුත් 2020 වන විට, අදාළ අගයන් නියමිත පරිදි හඳුනාගනු ලැබූ හෙයින් එම වටිනාකම් 2020 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන ලදී. 26% ලෙස වූ එම අගය තුළ ගිණුම්ගත කිරීමේදී වෙනත් ආදායම් ශීර්ෂවලට බැර කිරීම මත වූ අගයන්ද මේ වන විට නිවැරදිකර ඇති අතර, තවදුරටත් අය කළ යුතු ආදායම රු. 301,450,022.16 කි. | හිඟ ආදායම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

**2.3 වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්‍යාවශයෙන්ම දැරිය යුතු වැය විෂයයන් හඳුනාගෙන ප්‍රතිපාදන සලසා නොගැනීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයන් 02 ක එකතුව රු.5,400,000 ප්‍රතිපාදන සහ පුනරාවර්තන වැය විෂයන් 02 ක එකතුව රු.1,300,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත විදේශ සංචාර සිදු නොකිරීම මත ඉතිරිවීම, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශයට අයත්ව තිබූ ඇස්තමේන්තු අගයයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යංශයෙන් ඉවත් නොකිරීම මත ඉතිරිවීම හා IFAD ආයතනයේ නිර්දේශ මත ක්ෂුද්‍ර ණය ලබාදීම අත්හිටුවීම මත ඉතිරිවීම. | මු.රෙ.50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 15 ක් හා පුනරාවර්තන වැය විෂයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 කට වැඩියෙන් ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. උක්ත ප්‍රාග්ධන හා පුනරාවර්තන වැය විෂයයන් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු.1,641,700,000 ක් වූ අතර ඉන් රු.532,446,866 ක් එනම් සියයට 32 ක් ඉතිරි වී තිබුණි. | 2019 වර්ෂයේදී 2020 වර්ෂය වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාව වන විට සිටි අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය කාර්යය මණ්ඩලය මත පදනම්ව සකසා ඇස්තමේන්තු සඳහා ප්‍රතිපාදන සලසා දී ඇති අතර, අවසානයේදී එක් කාර්ය මණ්ඩලයක් සඳහා පමණක් ගෙවීම් සිදුවීම මත ඉතිරිවීම් සිදුවිම. | -එම- |
| (ඇ) | වැය විෂයන් 06 ක් සඳහා වෙන්කර තිබූ රු.546,220,000 ප්‍රතිපාදනයන්ගෙන් සියයට 18 ක් වූ රු.97,600,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 හා 69 මගින් වෙනත් වැය විෂයන් වෙත මාරුකර තිබුණි. ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුවද එම වැය විෂයන් 6 හි රු. 35,275,997 ක ප්‍රතිපාදන තවදුරටත් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත විදේශ සංචාර සිදු නොවීම මත ඉතිරිවීම් සිදු වූ හෙයින් ප්‍රතිපාදන අවැසි වෙනත් වැය විෂයයන් වෙත මාරුකර ගනිමින් උපයෝජනය කිරීම සිදු කර ඇත.<br>ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශයට අයත්ව තිබූ ඇස්තමේන්තු අගයයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යංශයෙන් ඉවත් නොකිරීම මත සිදුවූ ඉතිරිය.<br>2020 වර්ෂය තුල නිම කිරීමට බලාපොරොත්තු වූ කාර්යයන් නිසි කලට නිම නොවීම මත ඉතිරිවීම. එය අනියම් ඉතිරියකි. | -එම- |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | වැය විෂයයන් 12 ක් සඳහා මු.රෙ.66 හා 69 යටතේ එකතුව රු.97,600,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් ලබාගෙන තිබුණු අතර ඉන් වැය විෂයයන් 10 කට මාරු කරගෙන තිබූ ප්‍රතිපාදනයන් එම වැය විෂයයන්ගේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනය මෙන් සියයට 10 සිට සියයට 800 ක් දක්වා විය. | 20/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සංයුක්ත දීමනා වැඩිවීම සහ අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා අතිරේක ගෙවීම් සිදුකිරීම. අවශ්‍යතා වැඩිවීම සහ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණවල මිළ ගණන් වැඩිවීම, කොවිඩ් 19 වසංගත තත්වය මත අමාත්‍යාංශ නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැපයීමට සිදුවීම, ගොවිජන මන්දිරය ගොඩනැගිල්ල වෙත කෘෂිකර්ම අමාත්‍යාංශය ස්ථාපනය කිරීමට සිදුවීම මත සිදු කළ යුතු අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතු බලපා ඇත. | -එම- |

**2.4** **අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 ගිණුම් වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂයට වඩා කේවල ශේෂ ලැයිස්තුවේ එකතුව රු.22,677 ක් වැඩියෙන් සටහන් වී තිබුණි. උක්ත වැඩියෙන් සටහන් වීම නිවැරදි වූ ආකාරය සම්බන්ධ කිසිදු පැහැදිලි කිරීමක් ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රවර්තන වර්ෂයේදී කේවල ශේෂ ලැයිස්තුව පාලන ගිණුමට වඩා රු.1,598 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නොසැසඳුනු පාලන ගිණුම 2021 වර්ෂයේදී අමාත්‍යාංශ කිහිපයක ශේෂයන් ඒකාබද්ධ විම හා යළි ඉවත්වීම මත සිදුකළයුතු ගිණුම් ගැලපීම් රාශියක් තිබු අතර මෙම වෙනස සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අත්තිකාරම් පාලන ගිණුම් ශේෂ හා කේවල ශේෂ එකතුව සමාන විය යුතු හෙයින් වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |
| (ආ) | බදුල්ල දිස්ත්‍රික් වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂිකාගේ වර්ෂ ආරම්භක ණය ශේෂය රු.46,510 ක් වන නමුත් කිසිදු හේතුවකින් තොරව ණය වාරික අය නොකොට වර්ෂය තුළ වැටුප් ගෙවා තිබුණි. | බදුල්ල දිස්ත්‍රික් වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ S.M.A.M.A. ගුණවර්ධන මියගේ ශේෂයෙන් රු.7,240.35ක් අයවී ඇති අතර නියමිත පරිදි අවකරණය නොවීම පිළිබඳව ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගෙන් විමසා ඇති අතර 2021 වර්ෂයේදී උක්ත ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. | නිසි පරිදි ණය වාරික අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසරකට වඩා වැඩි කාලයක සිට පැවත එන මියගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.2,500ක උත්සව අත්තිකාරම් ශේෂය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.6 ඡේදයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවයේ නියුතුව සිටි කා.ක.ස (III) ශ්‍රේණියේ නිලධාරියෙකු වන මෙම නිළධාරියා මිය ගොස් ඇත. මේ වන තුරු ඔහුගේ විශ්‍රාම වැටුප හෝ මරණ පාරිතෝෂිතය ගෙවා නොමැති අතර අදාළ ණය මුදල මරණ පාරිතෝෂිකයෙන් අය කිරීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සේවය අතහැර ගොස් වර්ෂ 5 කට වැඩි කාලයක් සහිත නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.85,704 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 ඡේදයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | මෙයින් ඩී. එච්.රංචාගොඩ හා යු.ජී.පියසේන මයාගේ එකතුව රු.44,596 ක ණය ශේෂ කපා හැරීම සඳහා චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරි කටයුතු කරමින් පවතී. සිරිපාල පෙරේරා මයාගේ රු. 41,108ක ණය ශේෂය සම්බන්ධව නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරමින් පවති. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 ඡේදයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඉ) | අමාත්‍යාංශ ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවන අමාත්‍යවරයෙකුගේ රියදුරකු ලෙස කටයුතු කළ පුද්ගලයකු වෙත 2018 වර්ෂයේදී ලබාදී තිබූ උත්සව අත්තිකාරම් මුදල වූ රු.5,000 ක අගයෙන් කිසිදු වාරික ගෙවීමකින් තොරව සේවය අතහැර ගොස් තිබුණි. වසර 2 කට අධික කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 4.3 ඡේදයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | අප අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවය කරනු ලැබූ රියදුරු ඒ. ජී. ගමගේ 2018 වර්ෂයේ ලබාගත් උත්සව අත්තිකාරම් මුදලකි. එම ශේෂයෙන් රු. 5000ක ශේෂයක් තව දුරටත් අයවිය යුතුව පවතින අතර අදාල පියවීම පැහැර හැර ඇත.<br>ඔහුගේ ඇපකරු වූ යු. අයි. විතාරණ මහතා දැනට විදේශගතව ඇති අතර 2020.09.30 දිනැති 519/14 දරන ලිපියෙන් අදාළ ණය මුදල ගෙවන ලෙස ඔහුටද දන්වා විදේශ ලිපිනයට ලිපි යොමුකර ඇත. අයකර ගැනීම සඳහා තවදුරටත් පසු විපරම් කර කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 ඡේදයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත නිරවුල් කළයුතු නිලධාරීන් තිදෙනෙකුගේ එකතු වටිනාකම වූ රු.7,549 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත නිරවුල් කළ යුතු ශේෂ නිසි පරිදි නිරවුල් කළ යුතුය. |
| (උ) | අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන යන අංශ වල සේවය කර සේවය අතහැර ගිය නිලධාරීන් 29 දෙනෙකුගේ එකතුව රු.793,931 ක් වූ අය විය යුතු ණය ශේෂයන් වර්ෂ 05 ක කාලයක් ඉක්මවා ගොස් තිබුණද එම ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා කටයුතු කරමි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන පනතින් ප්‍රතිපාදන වෙන් කර නොතිබූ පුනරාවර්තන වැය විෂයයක් හා මූලධන වැය විෂයයක් සඳහා එකතුව රු.57,432,289 ක බැරකම්වලට බැඳී තිබුණු බව බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ [සටහන (iii)] දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම් 4 ක් මගින් ප්‍රතිපාදන සලසා දුන් අතර, මුල ලබාදුන් ප්‍රතිපාදනය අවසාන ප්‍රධාන අයවැය ගැලපීමේ දී එම කාල වකවානු සඳහා දරන ලද වියදම පමණක් සලකා ප්‍රතිපාදන ලෙස ලබා දීමට යෙදුනි. එහි දී මුලින් අතුරු සම්මත ගිණුම් මගින් සැලසුනු ප්‍රතිපාදන අහෝසි වුන අතර, ඒ වන විට දරන ලද වියදම් සඳහා පමණක් ඇස්තමේන්තු සලසා දෙන ලදි. නමුත් දැරිය යුතු වූ වියදම් වෙනුවෙන් බැදීම් බැරකම්වලට එළඹ තිබූ අතර, මෙම තත්ත්වය තුළ එම ගෙවීම් සඳහා අවකාශය නොවීය. | විධිමත් පරිදි බැරකම්වලට බැදීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ වැය විෂයයන් 13 ක් යටතේ සලසා තිබුණු රු.3,623,245,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ රු.3,614,071,270 ක් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිවීම් රු.9,173,730 ක් විය. එහෙත් එම ඉතිරිය ඉක්මවා රු.2,289,402,972 ක බැඳීම් හා බැරකම් සඳහා බැඳී තිබුණි. | 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම් 4 ක් මගින් ප්‍රතිපාදන සලසා දුන් අතර, මුල ලබාදුන් ප්‍රතිපාදනය අවසාන ප්‍රධාන අයවැය ගැලපීමේ දී එම කාල වකවානු සඳහා දරන ලද වියදම පමණක් සලකා ප්‍රතිපාදන ලෙස ලබා දීමට යෙදුනි. එහි දී මුලින් අතුරු සම්මත ගිණුම් මගින් සැලසුනු ප්‍රතිපාදන අහෝසි වුන අතර, ඒ වන විට දරන ලද වියදම් සඳහා පමණක් ඇස්තමේන්තු සලසා දෙන ලදි. නමුත් දැරිය යුතු වූ වියදම් වෙනුවෙන් බැඳීම් බැරකම්වලට එළඹ තිබූ අතර, මෙම තත්ත්වය තුළ එම ගෙවීම් සඳහා අවකාශය නොවීය. | මු.රෙ.94 ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හා බැඳීම් ඇතිකර නොගත යුතුය. |

**2.6 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් වර්ෂය අවසාන දිනට අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරය වෙත පියවා ඇතත් ගිණුම් යාවත්කාලීන වී නොතිබුණි. එලෙස යාවත්කාලීන නොවූ රු.4,134,769 ක අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් තුළ මාර්ගස්ථ මුදල් ලෙස හා ජංගම වගකීම් තුළ භාණ්ඩාගාරයට ගෙවියයුතු අගයක් ලෙස පෙන්විය යුතු වුවත් එසේ සිදුකර කර නොතිබුණි. | අවසන් ගිණුම් පිළියෙල කරනු ලබන්නේ අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලබන මූල්‍ය දත්ත මත පදනම්ව වේ.<br>අග්‍රිම ශේෂය භාණ්ඩාගාර ගිණුම යථාවත් වීම සිදුවන්නේ අමාත්‍යාංශයේ මුදල් පොත හර කරමින් සිදුකරන ලද ගෙවීම, භාණ්ඩාගාර ගිණුමට නිසි පරිදි බැරවූ පසුව වේ.<br>උදාහරණ ලෙස, බැංකු සැසඳුමක් පිළියෙල කිරීමේදී නිකුත් කළ නමුත්, නිශ්කාශනය නොවූ චෙක්පත්, මුදල් පොතේදී ශේෂය අඩුවීම ගැලපුව ද නියමාකාරයෙන් බැංකුව වෙතින් නිශ්කාශනය වූ පසුව බැංකුවේ ශේෂය අඩු වීම පෙන්නුම් කිරීම සැලකිල්ලට ගෙන එපරිදි මෙම කරුණ අවධානයට ගැනීම ඔබගේ පහසුව සඳහා ඉදිරිපත් කරමි.<br>ඒ අනුව, නිසි පරිදි අමාත්‍යාංශය වෙතින් අග්‍රිම ගිණුම නියමිත දිනට පියවීම් කර ඇති හෙයින්, ගිණුම්වල | මෙම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් තුළ මාර්ගස්ථ මුදල් ලෙස හා ජංගම වගකීම් තුළ ඇතුළත් කළ යුතුය. |

පෙන්වා ඇති ආකාරය නිවැරදි වේ. ACA 3 ආකෘති පත්‍රයට අදාළ වෙනසට හේතු සහිතව ඉදිරිපත් කර ඇත්තේ මෙම කරුණ නිසා වේ.

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>(i) මු.රෙ.104(2) | නැතිවීමේ හෝ පාඩුවීමේ වටිනාකම 50,000 කට වැඩි නම්, එවැනි නැතිවීම් හෝ පාඩු පිළිබඳ අවසන් වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් නියැදි පරීක්ෂාවන්ට ලක් වූ රු.50,000 ට වඩා වැඩි රු.6,285,211 ක පාඩු කපාහැරීම් සහිත වාහන අනතුරු 8 ක් සම්බන්ධයෙන් වන අවසන් පරීක්ෂණ වාර්තා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාහන අනතුරු 08 ට අදාළ අවසන් පරීක්ෂණ වාර්තා මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරිමට අතපසු වි ඇත. කඩිනමින් එම අවසන් වාර්තා භාණ්ඩාගාරයට යොමු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ.104(4) | ප්‍රාරම්භක පරීක්ෂණය සිදු කිරීමෙන් පසු අලාභ හානි සිදු වූ දිනයේ සිට තෙමසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් ගිණුම් වර්ෂය තුළ | වාහන අනතුරු වලට අදාළ පූර්ණ වාර්තා යොමු කිරීම ප්‍රමාද වී ඇති බව පිළිගනිමි. මු.රෙ 104(1) හා මු.රෙ 104 (4) පරීක්ෂණ සඳහා පත්කරනු ලබන්නේ අමාත්‍යාංශයේ | -එම- |

| | | | |
|---|---|---|---|
| | | පොත්වලින් ලියාහරින ලද එකතු වටිනාකම රු.6,302,461 ක් පමණ වන වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කිරීමට මාස 06 සිට මාස 33 ක් දක්වා කාලයක් ගෙන තිබුණි. | මාණ්ඩලික නිලධාරීන් වන අතර, එම නිලධාරීන්ට පැවරුණු නිත්‍ය රාජකාරිවලට අමතරව සිදු කළ යුතු අමතර කටයුත්තක් වන බැවින් එම නිලධාරීන්ගේ කාර්යබහුලත්වය හේතුවෙන්ද, පොලිස් වාර්තා ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් හා අනතුරු දැනුම්දීම ප්‍රමාද වීම හේතුවෙන් ද පූර්ණ වාර්තා සැකසීම ප්‍රමාද වී ඇත. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------------

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2.2 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක  අංක 118-1-10-1-1409 දරන වැය විෂය යටතේ වී මිලදී ගැනීම සඳහා ග්‍රාමීය සංවර්ධන අංශය වෙත රු.3,118,000,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ අතර ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 ක් සඳහා රු.1,959,912,319 ක් වී මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක් මගින් එයට අදාළව අංක 118-2003-07-00 දරන ආදායම් සංකේතය යටතේ මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණේ රු. 299,814,540 ක් පමණි. මේ අනුව වී විකිණීමෙන් රජයට ලැබිය යුතු සැලකිය යුතු හිඟ ආදායමක් ගණනය කර ඒවා  අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2** **කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් 08 දින බදු පදනම මත ලබාගත් රාජගිරියේ පිහිටි ගොඩනැගිල්ලේ බදු කාලය 2021 අප්‍රේල් 07 දක්වා තිබියදී කැබිනට් මණ්ඩල තීරණයයක් මත අමාත්‍යාංශය නැවතත් 2020 ජනවාරි 31 දින සිට ගොවිජන මන්දිරයේ ස්ථාපිත කරන ලදි. වර්ෂ 3 ක් අවසානයේ මාසික බදු කුලිය 15% කින් වැඩි කිරීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2020 ජනවාරි සිට 2021 මාර්තු 31 දක්වා වැඩි වූ බදු කුලී හා සේවා ගාස්තු ලෙස රු.44,239,137 ක් ගෙවා තිබුණි. | ප්‍රශ්න ගත බදු කුලී ගිවිසුම 2016.04.08 දින සිට 2021.04.07 දින දක්වා කාලයක් සඳහා ඇති කරගෙන තිබුණි. ගිවිසුම් ගත කාලය සඳහා බදු කුලී ගෙවීමටත්, පරිභෝජනය කරන විදුලිය සහ ජලය සඳහා නියමිත ගාස්තු ගෙවීමට ද ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබිණි. එසේම ගිවිසුම් ගත් කාලයට පෙර ගිවිසුමෙන් බැහැර වීමට හෝ කොන්දේසි කඩ කිරීමක් සිදු නොකර ගිවිසුම අවසන් කිරීමට හැකි වන ආකාරයේ ගිවිසුම අවසන් කරන වගන්තියක් ගිවිසුමේ අන්තර්ගත නොවීම හේතුවෙන් මෙසේ බදු කුලී හා සේවා ගාස්තුද ජල හා විදුලි බිල්පත් ද ගෙවීමට සිදුව ඇති බව දන්වමි. | පවතින නීතිරීති හා මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |